

හෙළදිව දහම් දිවයිනක් කළ සාංචිය පුද බිම

## ආත්ම චින්තනයට රුකුල් දෙන 'අන්තරාභව' මිථ්‍යාව

ඇතැම් පුද්ගලයන්ගේ මරණයෙන් පසු ඔවුන්ගේ ජීවිත පවත්නා ආකාරය පිළිබඳ ධර්මධරයන් අතර පවත්නා 'අන්තරාභවය' නමැති සංවාදශීලී සංකල්පය, මිථ්‍යාවක් බවට කරුණු දැක්වීමට කරන උත්සාහයකි.

## හෙළදිව දහම් දිවයිනක් කළ සාංචිය පුද බිම

– බාරාගෙදර ශ්‍රී පියතිස්ස නාහිමි

'සයුරෙන් එහා' විශේෂාංගය යටතේ ශ්‍රී ලංකාවේ ශාසනික උන්නතිය වෙනුවෙන් විශාල සේවයක් ඉටුකරන ලද භාරතයේ සාංචි පුද බිමෙහි ඓතිහාසික හා වත්මන් තොරතුරු

## අදටත් ගැලපෙන බුදුරදුන්ගේ දේශන කුසලතා

– නිශාන්ත පීරිස්

සැම යුගයට සරිලන බුදුරදුන්ගේ දියුණු අධ්‍යාපන ක්‍රම. සියලු ලෝක නියාම – ධර්මතා අවබෝධ කළ, පරිපූර්ණ ශාස්තෘවරයකු විසින් පුද්ගල විවිධත්වය අනුව සිදු කරනු ලැබූ දේශනා තුළින් හෙළිවන සුවිශේෂ අධ්‍යාපන කුසලතා.

## රටක් හදන හැටි දහම කියන හැටි

– වෛද්‍ය පියජ්ජය විතාන

බුදු දහම තුළ දැක්වෙන රාජ්‍ය පාලක මූලධර්මවල ඇති සනාතන අගය. සාර්ථක රාජ්‍ය පාලනයක් සඳහා ගුරු කොට ගත හැකි බෞද්ධ උපදේශ.

## ජීවිතයට නැණවත් පිළිතුර

– විතාරන්දෙණියේ වජිරවංශ හිමි

**අකුසල් දුරු කොට කුසලයෙන් පෝෂණය වීම, තමන්ගේ යහපත කැමැති දුරදක්නා නුවණැත්තාගේ ස්වභාවය බව පැහැදිලි කළ බුද්ධ දේශනාවකට අර්ථකථනයක්, වප් අව අටවක පෝද ධර්ම දේශනාවෙන්**

## බුදුරදුන් අනුදත් කඨින චීවර පූජාව

– කුරුණෑගොඩ පියතිස්ස නාහිමි

වස් තුන් මාසය තුළ සිදු කැරුණු වස් විසීම අවසන් කරමින් පෙරවස් පවාරණය සිදු කොට කඨින චීවරය පූජා කොට පැවරීමේ පින්කම් වස් පුර පසළොස්වක පෝද (පසුගිය ඔක්තෝබර් 20 වැනිද) සිට විහාරස්ථානවල සිදු කිරීමට නියමිතය. ඒ නිමිත්තෙන් කඨින පින්කම් පැවැත්විය යුතු ආකාරය හා එහි ආනිශංස දැක්වෙන ලිපියකි.

## මග – ඵල ලැබීම සිහිනයක් නොවේ – 3

– දෙල්ලොස්වල උදිතධීර හිමි

බෞද්ධ විමුක්ති ප්‍රතිලාභය බොහෝ දෙනා සිතන පරිදි යථාර්ථයට බොහෝ දුරින් පවතින්නක් නොවන බවත්, එය මේ ජීවිතයේ දීම මිනිස් බුද්ධිය මෙහෙයවා ලබාගත හැකි එකක් බවත් පැහැදිලි කෙරෙන ලිපි පෙළක තුන්වැන්න.

## තිදොර සංවරයෙන් ලැබෙන සැනසුමට නිදසුනක්

– ආර්. මහේන්ද්‍රසෝම

විවිධ උපකරණ භාවිතයෙන් බුදු දහමේ විවිධ ඉගැන්වීම් පැහැදිලි කර දීමේ ක්‍රමයක් හඳුන්වාදෙන මෙම ලේඛකයා, බෞද්ධ පිළිවෙතෙහි සඳහන් සිත – කය – වචනය සංවරය පිළිබඳ පහදා දීම සඳහා උණුවතුර බෝතලයක් උපමා කොට ගන්නා ආකාරය – මනඃකල්පිත කතාවක් ඇසුරෙන් පෙන්වා දෙයි.

## බෞද්ධ භික්ෂු සමාජයේ ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ

බෞද්ධ භික්ෂු සමාජය තුළ දක්නට ලැබෙන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ. බෞද්ධ දර්ශනයට අනුකූල ලෙස – එය ප්‍රායෝගිකත්වයට නැංවෙන ලෙස නිර්දේශ වී ඇති – ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ සහිත භික්ෂු විනය මූලධර්ම.

## Faith in Buddhism

*-(by Bhikkhu T. Seelananda - from USA)*